දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No ……………………………………

මගේ අංකය / எமது இல. / My No. ED/1/1/5/3

දිනය / திகதி / Date 2016. 04. 07

**චක්‍රලේඛ අංකය: 2016 / 11**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්
සියලුම විදුහල්පතිවරුන්

# පාසල් දරුවන් සඳහා චිත්‍රපට දර්ශන නිර්දේශ කිරීම

සිනමාව ප්‍රබල කලාත්මක, අධ්‍යාපනික සහ සන්නිවේදන මාධ්‍යයක් වන බැවින් ගුණාත්මක ප්‍රමිතියෙන් ඉහළ චිත්‍රපට පාසල් දරුවන්ට ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාව හා වැදගත්කම අධ්‍යාපන අමාත්‍යාංශය හඳුනාගෙන ඇත. ඒ අනුව, අධ්‍යාපනික වැදගත්කම සලකා, පාසල් දරුවන්ට සුදුසු චිත්‍රපට දර්ශන නැරඹීම සඳහා නිර්දේශ කිරීම සහ නැරඹීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මෙතැන් සිට පහත කොන්දේසි ක්‍රියාත්මක කෙරේ.

මීට පෙර **බාහිර පාර්ශ්වයන්ට පාසල් දරුවන් සඳහා නාට්‍ය සහ චිත්‍රපට දර්ශන හෝ වැඩසටහන් පැවැත්වීම ප්‍රමිතිගත කිරීම** යන මැයෙන් අධ්‍යාපන ලේකම්ගේ අත්සනින් 2012. 05. 17 දින නිකුත් කළ 2012/16 දරන චක්‍රලේඛය මෙයින් අහෝසි කෙරෙන අතර, චිත්‍රපට දර්ශන සම්බන්ධයෙන් 2016. 01. 01 දිනට පෙර යම් අවසරයක් ලබා දී ඇත්නම් ඒ සියලු අවසරයන් ද ඒ සමග ම අවලංගු වේ. තව ද, දරුවන්ට යම් සිනමා නිර්මාණයක් නැරඹීමට අවස්ථාව ලබා දීම පිණිස ආයතනයක් වශයෙන් පාසල මැදිහත් වීම ආශ්‍රිතව පමණක් මෙම කොන්දේසි අදාල වේ.

## 1.1 සිසුන්ට නැරඹීමට සුදුසු බවට අධ්‍යාපන අමාත්‍යාංශ නිර්දේශයට අත්‍යවශ්‍ය ගුණාත්මක ප්‍රමිතීන්

1.1 මෙම චිත්‍රපට දරුවන්ගේ වයස් මට්ටම්වලට ගැලපෙන වස්තු විෂයන්ගෙන් සමන්විත විය යුතු ය.

1.2 ශිෂ්ට සම්පන්න මනුෂ්‍ය පැවැත්මක වටිනාකම පිළිබඳ යහපත් ආකල්පවලින් දරුවන්ව පොහොසත් කරවිය හැකි, ඔවුන්ගේ සමබර පෞරුෂ වර්ධනය සඳහා උපකාරී විය හැකි, ඔවුන්ගේ රසඥතාව ප්‍රවර්ධනය කළ හැකි කලාත්මක සහ ගුණාත්මක ප්‍රමිතියෙන් ඉහළ මට්ටමේ නිර්මාණ විය යුතු ය.

1.3 චිත්‍රපට නිර්මාණ තුළ හුදෙක් දරුවන්ට වැදගත් යැයි තර්ක කළ හැකි ආකාරයේ අධ්‍යාපනික කරුණු, උපදේශ හෝ පණිවුඩ හෝ සිද්ධි අන්තර්ගත වීම පමණක්, එය දරුවන්ට නැරඹීමට සුදුසු බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශයට ලක් වීමට තරම් සුදුසු හේතුවක් නො වේ. එම අන්තර්ගතයන් කලාත්මක හා සෞන්දර්යාත්මක ප්‍රමිතීන්ගෙන් ඉතා ඉහළ මට්ටමින් පොහොසත් සිනමාත්මක ආකෘතියක් තුළින් ඉදිරිපත් වීම අනිවාර්ය කොන්දේසියකි.

1.4 රංගනයන් ඉතා ප්‍රශස්ත මට්ටමකින් සමන්විත විය යුතු අතර, අනෙකුත් ආනුෂංගික අංග ද ප්‍රශස්ත මට්ටමකින් පැවතිය යුතු වේ.

1.5 මෙම සියලු නිර්මාණයන් පාසල් පද්ධතියේ පිළිගත් වටිනාකම්වලට හානිකර නොවිය යුතු ය.

1.6 සංස්කෘතික හා සාමාජීය වශයෙන් නොගැලපෙන භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය යුතු ය.

1.7 මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයන්, ඝාතනයන් හෝ වධ හිංසා පැමිණවීම්වලට අදාල ප්‍රචණ්ඩකාරී දර්ශන, ගෘහස්ථ හිංසනයන් සහ ලිංගිකත්වය ඉස්මතු කොට පෙන්වන දර්ශන ඉදිරිපත් නොවිය යුතු ය.

1.8 චිත්‍රපටවල තේමාවන් / කතා වස්තූන් / ගී පද මාලා / දෙබස් ආදිය ජාති, ආගම්, කුල භේදවලට හා වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර, එවන් අදහස් ගම්‍ය වන පරිදි අර්ථකථනය නො විය යුතු ද වේ.

1.9 තමන් අයත් වන හෝ නියෝජනය කරන ජාති, ආගම්, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හෝ ප්‍රතිපත්තීන් හේතුකොටගෙන කිසියම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සමාජ කොට්ඨාසයක් අපහසුවට පත් විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම් ඇතුළත් නොවිය යුතු ය.

1.10 කෙතරම් ප්‍රශස්ත සිනමාත්මක හා කලාත්මක නිමාවකින් සමන්විත වුව ද, ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දීම මගින් ආයතනයක් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමාජය තුළ මතභේදාත්මක තත්වයකට මැදි වීමේ හෝ විවේචනයට ලක් වීමේ ඉඩකඩ සහිත සංවේදී සමාජ දේශපාලනික කරුණුවලින් යම් චිත්‍රපටයක් සමන්විත වේ නම් එවැනි නිර්මාණයක් සඳහා ද අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය නොලැබේ.

## 2. නිර්දේශිත චිත්‍රපටයක් පාසල් දරුවන්ට ප්‍රදර්ශනය කිරීමට අදාල අනෙකුත් කොන්දේසි

2.1 යම් චිත්‍රපටයක් පාසල් සිසුන්ට ප්‍රදර්ශනය සඳහා අවසර ඉල්ලීමේ දී අදාල ලේඛන සහිතව රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත අයදුම් කළ යුතු ය. එම චිත්‍රපටය ඉහත සඳහන් ප්‍රමිතීන්ට අනුකූල ද නැත් ද යන්න, රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලැබූ, අදාල ක්ෂේත්‍රයන් සම්බන්ධ ප්‍රාමාණික දැනුමකින් හා අවබෝධයකින් සමන්විත බාහිර විශේෂඥයන්ගෙන් සහ අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිතයන්ගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් මගින් පරීක්ෂා කර බැලීම අනිවාර්ය වේ.

2.2 බාහිර විශේෂඥයින් තිදෙනෙකුගෙන් සහ අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම ඇගයීම් කමිටුව පත් කෙරෙනු අතර, එහි සභාපතිත්වයට ද ඉහත බාහිර විශේෂඥයන් තිදෙනාගෙන් කෙනෙකු පත් කෙරේ. මෙම චක්‍රලේඛයේ 1.1 සිට 1.10 දක්වා සඳහන් ගුණාත්මක ප්‍රමිතීන් පිළිබඳව සවිස්තර වාර්තාවක් සමග, එම චිත්‍රපටය පාසල් දරුවන්ට නැරඹීමට සුදුසු/නුසුදුසු බවට නිර්දේශයක් මෙම ඇගයීම් කමිටුව විසින් ලබා දෙනු ඇත.

2.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජකාරි කටයුතුවලට බාධා නො වන පරිදි සහ ඒවාට ප්‍රමුඛතාව ලැබෙන පරිදි ඇගයීම් කටයුතු සිදු කෙරෙනු ඇති අතර, ඒ වන විට මහජන ප්‍රදර්ශනයට නිකුත් කර නොමැති චිත්‍රපටයක් නම්, අදාල ඇගයීම් දර්ශනය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් පරිශ්‍රයක දී කමිටුවට ප්‍රදර්ශනය කළ යුතු ය.

2.4 ඇගයීම සඳහා අයදුම් කිරීමේ දී, එක් චිත්‍රපටයකට ආපසු නොගෙවනු ලබන රු. 30,000.00ක මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත බැර කළ යුතු වේ. මෙම මුදල ඇගයීම් කටයුතු සඳහා යොදවාගන්නා බාහිර විශේෂඥයින්ගේ සමීක්ෂණ ගාස්තු සඳහා වැය කෙරෙනු ඇත. එහෙත් එම මුදල අය කිරීමේ හේතුව මත චිත්‍රපටය සඳහා අවසර ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය බැඳී සිටින බවක් එයින් කිසිසේත්ම අදහස් නොකෙරෙන අතර, අවසර ලබා දීම තීරණය වන්නේ ඇගයීම් කමිටු නිර්දේශය මත පමණි.

2.5 ජාතික චිත්‍රපට සංස්ථා පනත අනුව, චිත්‍රපට ප්‍රදර්ශනය සම්බන්ධ නිත්‍යානුකූල බලතල ජාතික චිත්‍රපට සංස්ථාව සතු බැවින්, කවර කාල වේලාවක වුව ද **පාසල් තුළ** චිත්‍රපට දර්ශන පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය කිසිදු අවසරයක් ලබා නො දේ.

2.6 පාසලේ මැදිහත්වීමෙන් දරුවන්ට ආසන්න සිනමා ශාලාවක චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලැබෙන්නේ **පාසල් කාල වේලාවෙන් පසුව** පමණි.

**3.0 සුදුසුකම් සපුරන චිත්‍රපට දරුවන්ට නැරඹීමට අවස්ථාව ලබා දීමට අදාල වෙනත් කොන්දේසි**

3.1 අධ්‍යාපනික අවශ්‍යතාවන් මත පදනම් වන මෙම කටයුතුවල සමස්ත වගකීම, නියාමනය හා අධීක්ෂණය අදාල විදුහලේ විදුහල්පති සහ එම විදුහල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ අදාල එම විදුහල අයත් පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ.

3.2 දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම අදාල විදුහලේ විදුහල්පති ප්‍රමුඛ ඒ සඳහා යෙදෙන අනෙකුත් ගුරුභවතුන් වෙත පැවරේ.

3.3 මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූලව දරුවන්ට ප්‍රදර්ශනය සඳහා අවසර ලබා ඇති හෝ ප්‍රදර්ශනය සඳහා යෝග්‍ය බවට නිර්දේශිත චිත්‍රපට පිළිබඳ තොරතුරු, සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත දන්වනු ලබන අතර, එම තොරතුරු අදාල ඇගයීම් නිර්දේශය ද සහිතව www.moe.gov.lk යන වෙබ් ලිපිනයේ අධ්‍යාපන අමාත්‍යාංශීය වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කෙරෙනු ඇත.

3.4 අදාල කලාපයේ කලාප අධ්‍යක්ෂගේ විධිමත් අවසර ලිපියක් නොමැතිව හුදෙක් චිත්‍රපට දර්ශන සංවිධායකවරුන්ගේ සහ සිනමාශාලාවල ලිපි ලේඛන හෝ ආරාධනාවන් අනුව කටයුතු කිරීම සපුරා තහනම් වේ.

3.5 අවසර ලබා දුන් චිත්‍රපටයක් සම්බන්ධයෙන් වුව ද පැමිණිලි හා චෝදනා ඉදිරිපත් වේ නම්, කරුණු පිරික්සා බලා ඕනෑම මොහොතක වහාම එම අවසරය අවලංගු කළ හැකි ය.

3.6 මේ ආශ්‍රිතව පාසලට අදාල චක්‍රලේඛ, නීති රීති, ව්‍යවස්ථා හා මූල්‍ය පරිපාටීන් කිසිවක් උල්ලංඝනය නොවිය යුතු ය.

3.7 ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීම සඳහා සිසු දරු දැරියන්ට හා දෙමාපියන්ට බල කිරීම සපුරා තහනම් ය. තව ද දෙමාපියන්ගේ එකඟතාවෙන් තොර ව පාසල විසින් දරුවන් සහභාගී නොකරවිය යුතු ය.

3.8 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය යටතේ ඉතා සාධාරණ සහන මුදලක් ප්‍රවේශ පත්‍රයක් සඳහා අය කළ යුතු අතර, එය එම සිනමා ශාලාව අයත්වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතියට ඉදිරිපත් කොට අවසර ලබා ගත යුතු ය.

3.9 රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇගයීම් කමිටුවේ යෝග්‍යතා නිර්දේශය සහ අවසරය රහිත ව **"පාසල් දර්ශන"** යනුවෙන් තම පූර්ව මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීම සපුරා තහනම් වේ. එමෙන් ම යම් අධ්‍යාපන කලාපයක පාසල් ආශ්‍රිතව "පාසල් දර්ශන" යනුවෙන් ප්‍රචාරක කටයුත්තක් සිදු කළ හැක්කේ ද

ඉහත නිර්දේශය මෙන් ම අදාල කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ ද පූර්ව අවසරය යටතේ පමණි.

3.10 මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූල නොවන පරිදි "පාසල් දර්ශන" යනුවෙන් තම ප්‍රචාරක කටයුතු සිදු කරන කිසිදු චිත්‍රපට දර්ශනයක් සඳහා **පාසල වෙනුවෙන්** තම දරුවන් සහභාගී කරවීම තහනම් වේ.

3.11 මෙම චක්‍රලේඛයේ කොන්දේසි උල්ලංඝනය වන පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් කිසිවෙක් කටයුතු කරන්නේ නම් ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූලව පියවර ගනු ලැබේ.

මෙම චක්‍රලේඛයෙන් ආවරණය නො වන යම් කරුණක් වේ නම් ඒ පිළිබඳ අවසාන තීරණය රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

ඩබ්ලිව්. එම්. බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය